00091

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන) උපාධි වැඩසටහන- 5 වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පසුබිම - ESU3137/SNU5237

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.11.24 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. සමාජානුයෝජනය අන්තර් ක්‍රියාකාරී ක්‍රියාවලියක් ලෙස සලකන්නේ මන් ද?

02. සෘණාත්මක සහ ධනාත්මක අනුදැනීම යන්නට උදාහරණ දෙක (02) බැගින් දක්වන්න.

03. සමාජානුයෝජන කාරක පහක් (05) නම් කරන්න.

04. නොබැඳුනු දෙමාපිය ශෛලිය විශේෂ අවශ්‍යතා සහිත ළමයින් කෙරෙහි ඇති කරන ප්‍රතිවිපාක මොනවා ද?

05. පහත දැක්වෙන දෑ සඳහා උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරන්න.

    1. සෘණාත්මක පරම්පරා අතර සංචලනය
    2. ධනාත්මක පරම්පරාව තුළ සංචලනය

06. සමාජමිතික තත්ව කණ්ඩායම් තුනක් (03) දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

07. වැඩ ලෝකය තුළ රැඳී සිටීම සඳහා අවශ්‍ය දුබලතා සහිත ළමයින් තුළ අඩුවෙන් දක්නට ලැබෙන කුසලතා පහක් (05) ලැයිස්තුත ගත කරන්න.

08. පහළ සමාජ ආර්ථික පසුබිම, විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ඉගෙනුම කෙරෙහි ඇති කරන ප්‍රතිවිපාක තුනක් **(03)** පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. I. දුබලතා සහිත ළමයින් සම්බන්ධව ප්‍රති සමාජානුයෝජන ක්‍රියාවලිය උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. දුබලතා සහිත ළමයින් ප්‍රති සමාජානුයෝජන ක්‍රියාවලිය තුළ මුහුණපාන අභියෝග මොනවා ද? (ලකුණු 10)

10. I. 'දුබලතා සහිත දරුවකු බිහි කිරීම විශේෂයෙන් මව්වරුන් කෙරෙහි අනවශ්‍ය පීඩනයක් සහ සෘණාත්මක බලපෑමක් ඇති කිරීමට හේතු වේ.'

ඉහත ප්‍රකාශය උදාහරණ සහිතව සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

II. තම දරුවන්ට වඩා හොඳ ජීවිතයක් සහතික කිරීම සඳහා විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ මව්වරුන් තම සාම්ප්‍රදායික භූමිකාවෙන් එපිටට ගොස් ඇත්තේ කෙසේ ද? (ලකුණු 10)

11. "පන්ති කාමරයේ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් විධිමත් සහ අවිධිමත් ලෙස සමාජානුයෝජනය කිරීමේ දී බොහෝ ගුරුවරුන් අභියෝගවලට මුහුණ දෙති."

I. අන්තර්කරණ පන්ති කාමර තුළ ගුරුවරුන් මුහුණ දෙන එවැනි අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. අන්තර්කරණ පන්ති කාමර තුළ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයි විධිමත් සහ අවිධිමත් ලෙස සමාජානුයෝජනය කිරීමට සමවයස්කයන්ගේ සහය ලබා ගත හැකි ආකාර පරීක්ෂා කරන්න. (ලකුණු 10)

12. I. පාසල් තුළින් ගිලිහීමේ අවදානමක් ඇති ළමයි කණ්ඩායම් පහක් (05) දක්වන්න. (ලකුණු 05)

II. එම ළමයින්ගේ පාසලින් ගිලිහීමේ අවදානමට බලපෑ හැකි හේතු මොනවා ද? (ලකුණු 07)

III. ගිලිහීම අවම කර ගැනීමට පාසල් මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 08)

13. I. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට පාසලෙන් වැඩ ලෝකයට මනා සංක්‍රමණයක් සහතික කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද?

(ලකුණු 10)

II. දුබලතා සහිත ළමයින් වැඩ ලෝකයට සංක්‍රමණය කරවීම සඳහා රජය අනෙකුත් සංවිධාන සහ ප්‍රජාව පහසුකම් සැළසිය යුත්තේ කෙසේ ද?

(ලකුණු 10)

14. I. පවුලෙන් සහ ජනමාධ්‍ය තුළින් සිදුවන සමාජානුයෝජනය අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. "ජන මාධ්‍ය කෙරෙහි අනවශ්‍ය ලෙස ඇබ්බැහි වීම විශේෂ අවශ්‍යතා සහිත ළමයින් කෙරෙහි ඍණාත්මක බලපෑම් ඇති කිරීමට හේතු වේ."

විශේෂ අවශ්‍යතා සහිත ළමයින් කෙරෙහි ඇති විය හැකි එවැනි ඍණාත්මක බලපෑම් උදාහරණ ආශ්‍රයෙන් විභාග කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.

0009

THE OPEN UNIVERSITY OF SRI LANKA

FACULTY OF EDUCATION

BACHELOR OF EDUCATION (SPECIAL NEEDS EDUCATION)

DEGREE PROGRAMME 2017/2018

LEVEL - 05

FINAL EXAMINATION 2018

ESU3137/SNU5237 – SOCIOLOGICAL FOUNDATION OF SPECIAL NEEDS EDUCATION

DURATION – THREE (03) HOURS

| Date: 24.11.2018 | Time: 09.30 a.m. – 12.30 p.m. |
| --- | --- |

**Answer All Questions in Part I and any three (03) questions from Part II.**

## PART - I

01. Why socialization is considered as an interactive process?

02. Indicate **two (02)** examples for each negative and positive sanctions.

03. List out **five (05)** agents of socializations.

04. What are the consequences of disengaged parenting style on children with special needs?

05. Indicate **two (02)** examples for each of the following:
    i. negative inter-generation mobility.
    ii. positive intrageneration mobility.

06. Indicate **three (03)** socio metric status groups and explain one of them.

07. List out **five (05)** skills which are needed to retain in the world of work in children with disabilities.

08. Explain **three (03)** consequence how low socio-economic background affect on the learning of children with special needs.

(5 x 8 = 40 marks)

## PART - II

09. i. Explain with examples the process of re-socialization in relation to children with disabilities.

(10 marks)

ii. What ae the challenges faced by children with disabilities in the process of re-socialization?

(10 marks)

10. i. 'Giving a birth to an infant with disabilities brings unnecessary pressure and negative impact particularly on mothers'.. Justify the above statement with example.

(10 marks)

ii. How do mothers of children with special needs go beyond their traditional roles to ensure a better life for their children?

(10 marks)

11. 'Most of the teachers face challenges formally and informally when socializing the children with special needs in the classroom.

i. Explain such challenges faced by teachers in an inclusive classroom setting.

(10 marks)

ii. Examine the ways and mean in obtaining peer support formally and informally when socializing children with special needs in inclusive class room setting.

(10 marks)

12. i. Indicate **five (05)** groups of children who are at the risk to dropping out from schools.

(05 marks)

ii. What are the reasons which will affect the risk of school drop out of these children?

(07 marks)

iii. Suggest possible ways to minimize dropouts at school level.

(08 marks)

13. i. What are the measures could be taken to ensure smooth transition of children with special needs from school to the world of work?

(10 marks)

ii. How do the government, the other organizations and community should facilitate smooth transition of children with disabilities in to the world of work?

(10 marks)

14. i. Explain the differences of socialization through family and mass media.

(10 marks)

ii. 'Unnecessary addictions to mass media bring negative impacts on children with special needs'
Investigate citing examples such negative impacts on the development of children.

(10 marks)

*-Copyrights reserved-*